# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1868/55 - 2014 ජුනි මස 25 වැනි බදාදා - 2014.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල
පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත
(262 වන අධිකාරය වූ)
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ
කටුනායක - සීදූව නගර සභාවේ
සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

බස්නාහිර පළාතේ පළාත් සභාවට තේරීපත් වීම හේතුකොට ගෙන කටුනායක - සීදූව නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

හමුදු ධම්මික ලලන්ත ගුණසේකර නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ කටුනායක - සීදූව නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන නිමල් සිල්වා හඳුන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කටුනායක - සීදූව නගර සභාවේ තේරීම්භාර නිලධාරී පතිරාජ ආරච්චිල්ලාගේ සුනිල් සේනාරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, නිමල් සිල්වා හඳුන් මහතා කටුනායක - සීදූව නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම්භාර නිලධාරී,
කටුනායක - සීදූව නගර සභාව.

2014 ජුනි මස 23 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

07 - 309


1A - G 019788 — 15 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*